**10.** **ශීර්ෂය 10 - අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව**

**---------------------------------------------------------------------------------------**

**10.1** **විගණන විෂය පථය**

**------------------------**

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 අගෝස්තු 15 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**10.2** **ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**------------------------------------------------------------------------------------------------------**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**10.3** **විගණන නිරීක්ෂණය**

**------------------------**

2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ආ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 10.4 සිට 10.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉදිරිපත් කරන ලද ගිණුම අනුව 2013 දෙසැම්බර් 31 දිනට ඉල්ලා අස්වීම මත අයවීමට ඇති හිඟහිට තිබූ ශේෂවල එකතුව රු.133,827ක් වූ අතර එය වර්ෂ 7 කට වැඩි කාලයකට අදාල විය.

(ii) දෙපාර්තමේන්තු පොත් අනුව හා භාණ්ඩාගාර පරිගණක වාර්තා අනුව ආරම්භක හා අවසාන ශේෂයන්හී රු.236,827 ක වෙනසක් විය. මුදල් රෙගුලාසි 427 ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ පොත් භාණ්ඩාගාරයේ පොත් සමඟ සසඳා නොතිබුණි.

**(ආ) නොපියවන ලද අත්තිකාරම්**

---

ඉදිරිපත් කරන ලද ගිණුම අනුව 2013 දෙසැම්බර් 31 දිනට නිරවුල් නොකරන ලද අල්ලස් වැටලීම් සඳහා පරිහරණය කිරිමට ලබාදුන් අත්තිකාරම් ශේෂවල එකතුව රු.18,585,932 ක් වූ අතර එයින් වර්ෂ 4 සිට වර්ෂ 30 දක්වා වූ කාලයකට අදාළ ශේෂය රු.5,467,922 ක් විය. ඒ පිළිබඳ කාල විශ්ලේෂණයක් පහත දැක්වේ.

| **කාල පරාසය** | **නඩු සංඛ්‍යාව** | **වටිනාකම** |
|---|---|---|
| | | රු. |
| වසර 3 ත් 4ත් අතර | 44 | 868,500 |
| වසර 5 ත් 10 ත් අතර | 88 | 4,349,825 |
| වසර 10 ත් 20 ත් අතර | 31 | 233,320 |
| වසර 20 ත් 30 ත් අතර | 09 | 13,850 |
| වසර 30 ට වැඩි | 08 | 2,427 |
| | 180 | 5,467,922 |

ඉහත සඳහන් නඩු 180 තුළ 2013 දෙසැම්බර් 31 දින වන විට නෛතික කටයුතු නිම වී තිබුණු නඩුවලට අදාල අත්තිකාරම් නිරවුල් කළ හැකිව තිබුණත්, එම අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණු අවස්ථාද නිරීක්ෂණය විය.

**10.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

-----------------------------------------

**10.4.1 වාර්ෂික කාර්යසාධන වාර්තා**

--------------------------------

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර සභාව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**10.4.2 අභ්‍යන්තර විගණනය**

----------------------

කොමිෂන් සභාව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

**10.4.3 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම**

---------------------------------------------------------

විගණන හා කළමනාකරණ කමිටුව ස්ථාපිත කර නොතිබුණි.

**10.5 කාර්යසාධනය**

----------------

2013 දෙසැම්බර් 31 දිනට විමර්ශනය කරමින් පවතින පැමිණිලි සංඛ්‍යාව 2,182 ක් වූ අතර එයින් වසර 2 කට වැඩි කාලයක් ගතවී ඇතත් තවදුරටත් විමර්ශනය කරමින් පවතින පැමිණිලි සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **කාලය** | | **පැමිණිලි සංඛ්‍යාව** |
|---|---|---|
| -------- | | ------------------- |
| වසර 4 ක් හෝ ඊට වැඩි කාලයක් ගත වී ඇති පැමිණිලි | - | 188 |
| වසර 3 ක් ගත වී ඇති පැමිණිලි | - | 170 |
| වසර 2 ක් ගත වී ඇති පැමිණිලි | - | 494 |
| | | ----- |
| | | 852 |
| | | === |

මේ අනුව 2013 දෙසැම්බර් 31 දිනට විමර්ශනය කරමින් පවතින පැමිණිලිවලින් සියයට 39 ක් වසර 2 සිට වසර 4 හෝ ඊට වැඩි කාලයක් පැරණි ඒවා බව නිරීක්ෂණය විය.

**10.6 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 34 | 20 | 14 |
| (ii) තෘතියික මට්ටම | 05 | 01 | 04 |
| (iii) ද්විතියක මට්ටම | 62 | 53 | 09 |
| (iv) ප්‍රාථමික මට්ටම | 64 | 59 | 05 |
| **එකතුව** | **165** | **133** | **32** |

2013 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ පුරප්පාඩු තනතුරු 32 ක් පිරවීමට කොමිෂන් සභාව විසින් කටයුතු කර නොතිබුණි.